# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/47 - 2018 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා - 2018.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3(1) වගන්තිය යටතේ දැන්වීම**

**මෑත අතීතයේදී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අභ්‍යන්තරව අවතැන් වූ හා වෙනත් ස්ථානයක ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි නොවූ ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වූ පරිපූරක ලැයිස්තුව - 2018**

ඉහත කරුණට අදාළ පරිපූරක ලැයිස්තුව, සකස් කිරීමට අදාළ අයදුම්පත් කැඳවීම 2018.11.01 දිනෙන් අවසන්ව ඇත. ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ විශේෂ විධිවිධාන පනත ප්‍රකාර එකී පරිපූරක නාමලේඛනයේ තම නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තම නම පරිපූරක ලැයිස්තුවේ ඇතුළත්ව නොමැති කිසිවෙකු විසින් තමාගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් අභියාචනා ඉදිරිපත් කර සිටින්නේ නම් එසේ අභියාචනා ඉදිරිපත් කර සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්ද හිමයන් ලියාපදිංචි කිරීමේ පනත පරිදි හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයේ වූ ඉල්ලීමක් ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති දෙකක් ඇතුළත (2018.11.15 දින දක්වා) මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු ය.

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවෙහි නම ඇතුළත්ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී නාමලේඛනයේ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත්කර තිබීම ගැන හෝ තිබෙන්ට හැරීම ගැන හෝ විරෝධතාව දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාව යථෝක්ත පනතේ නියම කර ඇති පරිදි අවස්ථාවෝචිත ''ඇ'' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම අදාළ දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත (2018.11.15 දින දක්වා) ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු ය.

යම් කිසි හිමිකමක් ඉදිරිපත් කිරීම සඳහා ද යම් කිසි කෙනෙකුගේ නමක් නාමලේඛනයේ ඇතුළත් කරන ලෙස හෝ තිබෙන්නට හරින ලෙස හෝ යම් කෙනෙකු විසින් කරනු ලබන හිමිකම් ඉල්ලීමක් සඳහා විරුද්ධතාව දැක්වීමට අවශ්‍ය ආකෘති පත්‍ර ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබාගත හැකිය.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්. එම්. ටී. ඩී. හේරත්,<br>
ලේකම්,<br>
මැතිවරණ කොමිෂන් සභාව.

2018 නොවැම්බර් මස 02 වන දින,<br>
රාජගිරිය,<br>
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

11- 775

1A - G 28847— 37 (2018/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*